**වර්ෂ 2022 මාර්තු 11 වන දින පෙ.ව. 09.00 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.00 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.30 දක්වා කල්තැබීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කැළුම් ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.45 |
| 2. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 08.47 |
| 3. | ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 9.00 |
| 4. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 9.01 |
| 5. | ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බන්ඩාර මිය | පෙ.ව. 09.05 |
| 6. | ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 09.10 |
| 7. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.10 |
| 8. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 09.10 |
| 9. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 09.30 |
| 10. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.30 |
| 11. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | ප්‍රභාත් ජයසූරිය මහතා | පෙ.ව. 09.30 |
| 12. | ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.30 |
| 13. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.30 |
| 14. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.30 |
| 15. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | ප.ව. 09.30 |
| 16. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.30 |
| 17. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව.. 9.50 |
| 18. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | ඩබ්.කේ.තිලකාවති මිය | පෙ.ව. 09.50 |
| 19. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.50 |
| 20. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 09.51 |
| 21. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 09.56 |
| 22. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 09.56 |
| 23. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.58 |
| 24. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරන මහතා | පෙ.ව. 09.58 |
| 25. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 9.59 |
| 26. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 10.00 |
| 27. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 10.00 |
| 28. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදුෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.00 |
| 29. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 10.05 |
| 30. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.07 |
| 31. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 10.10 |
| 32. | ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 10.20 |
| 33. | ගරු ප්‍රාසම | එ.ජා.ප | මුදිතා ශ්‍රිමතී මිය | පෙ.ව. 10.20 |
| 34. | ගරු ප්‍රාසම | ශ්‍රි .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | ප.ව. 10.30 |
| 35. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | ප.ව. 10.30 |
| 36. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.30 |
| 37. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 11.00 |
| 38. | ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | ප.ව. 11.00 |
| 39. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 11.00 |
| 40. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී.ජීවන් අබේවික්‍රමපාල මහතා | පෙ.ව. 10.01 |
| 41. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 10.05 |
| 42. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 10.10 |
| 43. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්. ජයලත් මහතා | ප.ව. 10.15 |
| 44. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 11.30 |

## 01-01 සභා වාර්තාව සභා සම්මත කිරීම.-(2022.02.11)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා මහතා :-**

2022.02.11 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.පී.පි.තරංග නිල්මිණි මහතා :-**

2022.02.11වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

1. ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2022.02.11 වාර්තාවේ අංක 2 විශේෂ නිවේදන- නොමැත යනුවෙන් මුද්‍රන දෝෂයකින් මුද්‍රනය වි ඇති අතර එම වචනය ඉවත් විය යුතුය.**

**Xxxxxxxxxxxxx** 2022.02.11 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

**ප්‍රේමරත්න මල්කැකුල,**
**ගරු සභාපති,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට**

2. <u>**සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -**</u> නොමැත.

3. <u>**ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත**</u>

4. <u>**යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-**</u> **නොමැත**

5. <u>**යථා පරිදි කල්දී ඇති යෝජනා :-**</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**<u>05-01</u>. මෙනේරිපිටිය ශ්‍රී සුධර්ශනාරාම විහාරස්ථානයට , ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන වලාකුළු බැම්ම ඉදි කිරිමේ යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
**මෙනේරිපිටිය ශ්‍රී සුධර්ශනාරාම විහාරස්ථානයට , ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන වලාකුළු බැම්මක් ඉදි කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව මෙනේරිපිටිය ශ්‍රී සුධර්ශනාරාම විහාරස්ථානයට , ගරු ආණ්ඩුකාරතුමාගේ

අනුමැතිය ලබාගෙන වලාකුළු බැම්ම ඉදිකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

**05-02.** මෙනේරිපිටිය මැද කඩේ අසලින් ආරම්භ වන උඩ කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මෙනේරිපිටිය මැද කඩේ අසලින් ආරම්භ වන උඩ කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව මෙනේරිපිටිය මැද කඩේ අසලින් ආරම්භ වන උඩ කුඹුර මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-03.** කුරුවිට නගරයේ ගොඩනැගිල්ලක් ඉදිකර එහි එක් එක් ගම්මානවලට ආවේනික ද්‍රව්‍ය විකුනා ගැනීම සඳහා සතියේ දින 07 ම අවස්ථාව ලබාදීමට කටයුතු කිරීමේ යෝජනාව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

කුරුවිට නගරයේ ගොඩනැගිල්ලක් ඉදිකර එහි එක් එක් ගම්මානවලට ආවේනික ද්‍රව්‍ය විකුනා ගැනීම සඳහා සතියේ දින 07 ම අවස්ථාව ලබාදීමට කටයුතු කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

කුරුවිට නගරයට තදාසන්න එරත්න, දෙව්පහල තෙප්පනාව ආදී ප්‍රෙද්ශවල ට ආවේනික නිෂ්පාදන ,ආහාර ද්‍රව්‍ය ගෙනත් නගරයේ අලෙවි කර ගැනිමට පහසුකම් සැලසීම

සම්බන්ධයෙන් මම විවිධ වර යෝජනා කලා. මෙ වන විටත් මම යෝජනා කල දෑ සම්බන්ධයෙන් සාකච්ජා 2 ක් තියලා වෙබ් පිටු හදල යම් යම් කටයුතු ප්‍රවර්ධනය කිරිමට කටයුතු කලා.විශේෂ වැඩපිලිවෙලක් සැකසුවා.එහි එක් අංගයක් තමා මේ කුරුවිට නගරයට එන පිට ජනතාවට තම නිශ්පාදන අලෙවි කර ගැනීමට අලෙවි කුටි සැකසිම. බිත්ති ඕනි නෑ.ලොකු ගොඩනැගිලි නෙමේ.වහලක් ගහලා සරල ස්ථානයක්.තම බඩු ටික තියාගන්න.දෛනික ආදායමක් ගන්න.දින 7 ම දෙමු. උදාහරනයක් දෙව්පහල බටපොතු නිෂ්පාදන හදනවා.දෙස් විදෙස් කව්රුත් කැමතියි.එක් දිනයක් අපි දෙව්පහලට වෙන් කරනවා.එක් එක් ප්‍රෙද්ශ වලට වෙන වෙන දින. මේවා සාකච්ජා කරලා ගැලපෙන ලෙස සකසා ගත හැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා</u>

ගරු මන්ත්‍රිතුමා වැදගත් යෝජනාවක් කලේ. මමත් කලකට පෙර පොල හදන කොට මේ වගේ පොදුවේ තැනක් හදමු කියලා යෝජනා කලා. මෙ යෝජනාව ඉතා හොඳයි.අදටත් ගම්බද නිෂ්පාදන කඳංගොඩ , ගෝනපිටිය,පාතගම.ආදී ප්‍රදේශවල මඤ් ඤොක්කා ,බතල ටික අලෙවි කරගන්න ගලවලා විකුනාගන්න තැනක් නෑ.වෙළදාම් කරන වෙලෙදුන්ටයි දෙන්න වෙලා තියෙන්නේ ,අතරමැදියන්ට. ව්‍යාපාර කරන අය නගරය තමන්ගේ කරගෙන .ගමේ අයට වෙලදාමක් කරන්න බෑ.පසුගිය කොරෝනා කාලේ ගමේ බලපත්‍රයක් හදාගෙන ඇවිත් එලවළු ටිකක් විකුනන්න හදපු අයත් අත් අඩංගුවට ගත්තා.තර්ජනය කලා.ඒ ව්‍යාපාරිකයන් නිතිමය අතිනුත් බල පරාක්‍රමය හදාගෙන.ගමේ සැබෑ ගොවියන්ට තැනක් ලැබේවිද?කුටියට එකවර දින 7 ම මුදල් ගෙවලා ඇතැම් අය අරක් ගනීද? සැබෑ ගොවියට නිදහසේ වෙළදාම කරගන්න හැකි නම් ඉතා හොඳයි.
ගරු මන්ත්‍රිතුමා කිව විධිහට ඇත්තටම කඳංගොඩට, පාතගමට ඉඩක් ලැබේවිද?දින 7 සාධාරනව බෙදේද?යම් ක්‍රමවේද හැදිය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්කේ. විජේසිරි මහතා-</u>

මේ වන විටත් ඇතැම් අය ආහාර නොවන නිෂ්පාදන ඔලුව උඩ තියාගෙන අලෙවි කරනවා.මේ බඩු අලෙවි කුටියක ඉන්න කෙනෙකුට හරි අලෙවි කරගන්න හැකි නම් ඒකත් වටිනවා නේද? ප්‍රායෝගිකව සොයා බලා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක මහතා-</u>

යෝජනාව ස්ථිර කරමි.කුරුවිට කඩ තියෙන අයට මේ කඩ දෙනවට විරුද්ධයි.නගරයේ ඒකාධිකාරයක් තියෙන්නේ.කොවිඩ් කාලෙත් උනේ ඒක.බොජුන් හලට සමගාමීව කලා නම් හරි. ගම්වල අයට නොදි තොග වෙලෙදුන්ට දුන්නට වැඩක් නෑ.විනිවිදව කරන්න.නැත්නම් විරුද්ධයි.මේවට වැඩිපුරම බැනුම් අහන්නේ විවේචන වෙන්නේ මෙතුමාවයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

මේ සැකය සාධාරනයි. ඊයේ වැසිකිලිය ගඳ ගහනවා කියලා කීවා කියල නිලධාරියෙක් මට බැන්නා.මං සභාව දැනුවත් කරනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
මන්ත්‍රී යෝජනා යටතේ වෙනත් කරුණු වලට අවස්ථාවක් නොමැත.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා
මේ කරන කටයුතු සද්භාවයෙන් කල යුතුයි.කුරුවිට වෙළඳ මාපියාවක් තියෙන්නේ.කීප දෙනෙක් අතර බෙදී යන්නේ.එරත්න කිතුල් නිෂ්පාදන එළවළු ටිකට වෙළඳපලක් නෑ.සෝමරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව එක්ක මේවාට ස්ථානයක් ලැබෙනවා.එත් අතරමැදි කණ්ඩායම් හැදුනොත් පගාව දෙනවා වගේ වෙයි.ඒවගේම යම් අක්‍රමිකතා උනොත් ගමේ මිනිස්සු කියන්නේ අපිට.අපි ගමේ ඉන්න ඕනි. ඒ නිසා කරන දේ සාධාරනව කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නයනා ජීවනි මිය

මේ යෝජනාව කාලෝචිතයි. මීට පෙර ළමා හා කාන්තා කමිටුවේදි කීවා කතුන්ට තම නිෂ්පාදන අලෙවි කර ගන්න බොජුන් හලේ කොටසක් දෙන්න කියලා.එසේම එරත්න එලවළු නම් එදාට එළවළු විතරයි.දීප්ති මන්ත්‍රීතුමා කී ගැටළුව නෙවෙන්න ප්‍රදේශ වලට බෙදන්න.ගරු මන්ත්‍රීතුමාලට පුළුවන් අධික්ෂනය කරන්න.ගොඩක් රටේ එලවළු ගනන්.දේශිය දේට මුල් තැන දිලා කුරුවිට වවන දේ විතරක් මේකේ විකුනන්න ඕනි.ඉක්මනට ක්‍රියාත්මක කලොත් අපේ ආර්ථිකය මේ ගමේ ජනතාවගේ ආර්ථිකය නංවන්න පුළුවන් වේවි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා

මමත් මේ මූලික සාකච්ජාවේ හිටියා.කුරුවිට ප්‍රදේශයට ආවේනික අගයන්, ද්‍රවය දේ ප්‍රචලිත කිරීම ඉතා වැදගත්.ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය නංවාලිමට දේශිය ආර්ථිකය නංවන්න ඕනි.ස්ථිරයි. මේක කලාප 7 කට බෙදලා කරන්න ගියොත් විශාල පිරිසක් එයි.විකුනාගන්න බැරිවෙයි.ඒනිසා ක්‍රමවේද අවශ්‍යයි.උදාහරන විදිහට නියෝජිතයෝ දාලා අලෙවිය. මල් සංගමය. රස කැවිලි සංගම් තියෙනවා.සේරම අය ඇවිත් බෑ. කුටි කීයක් හදන්නද?බතික් සමිති යෙන් ඒ නියෝජිතයෝ. ගම්වල පුංචි පුංචි සංවිධාන තියෙනවා.නියෝජිතයෝ අලෙවි කරයි.කිතුල් පැණි හකුරු දැන් ඉල්ලුමක් තියෙනවා.හොඳ තත්වයෙන් දුන්නොත් ජනතාව හොයාගෙන ඇවිත් ගනී.මේ දේවලට ගැලපෙන ක්‍රම වේද හදමු. සැම ගොවියටම එන්න බෑ. ප්‍රායෝගික නෑ.බිම්මල්,බතික්,රසකැවිලි,මල් ආදිය විධාතා කරනවා.ගන්න පුළුවන්. නැති ඒවට ක්‍රම හදමු.අපිට ආවේනික විශේෂ දේ විතරයි. තොග වෙලෙදුන්ට දුන්නොත් අසාර්තකයි. එය මාපියාවක් වෙයි.ඒ නිසා ක්‍රම වේදයක ට කරලා සාර්ථක කර ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා

ස්ථිරයි.මේ වෙන කොට අපේ ගම්වල ගම්මුත් එලු, මී කිරි,එල කිරි වගේ ද්‍රව්‍ය අලෙවි කරගන්න විධිහක් නැතිව ඉන්නේ.නගරයේ එල කිරි නෑ.ඒ නිසා මං ඉල්ලනවා හදන කුටියක් කිරි නිෂ්පාදන වලටත් දෙන්න කියලා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
**සෝමරත්න මන්ත්‍රිතුමාගේ යෝජනාව සද්භාවයෙන් ගෙනාවේ.දැන් මේ අපි සාකච්ජා කලේ මේ කාරනාව ඉටු උනා වගේ.සතුටුයි.අපි බලාපොරොත්තු තියාගමු .බොජුන්හල යෝජනාවත් ක්‍රියාත්මක උනොත් යහපත්.ව.කි.මී.263 ජනතාවටම හොඳයි. සභා බල සීමාවේ ජනතාවට තම නිෂ්පාදන වැඩි මිලකට අලෙවි කරලා ජීවන තත්වය යහපත් කර ගන්න පුළුවන්.පසුගිය කාලේ කලු කඩ තිබුනේ.ඩිලාන් මන්ත්‍රිතුමා කිවා වගේ විශාල පිරිසකට එන්න බෑ. අපි ක්‍රම වේද හදමු. ඉදිරියේදි මේ සම්බන්ධව කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා ගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ ගොඩනැගිල්ලක් ඉදිකර එහි එක් එක් ගම්මානවලට ආවේනික ද්‍රව්‍ය විකුනා ගැනීම සඳහා සතියේ දින 07 ම අවස්ථාව ලබාදීමට කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා මෙදින සභාවට සහභාගි වී නොමැති අතර එම යෝජනාඅංක 05-04,05-05,05-06, ඉදිරි සභාවට යොමු කරමු.එසේම 05-07 අංකය මුද්‍රණ දෝෂයකින් න්‍යායපත්‍රයට ඇතුලත් වී ඇති අතර එය යටතේ යෝජනාවක් නොමැති බව දැනුම් දෙමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තුරි මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-08.** කුරුවිට නගරයේ හෙල බොජුන් හල ඉදි කිරිම කඩිනම් කිරීමේ යෝජනාව

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයා කස්තුරි මිය</u>
**කුරුවිට නගරයේ හෙල බොජුන් හල ඉදි කිරිම කඩිනම් කිරීමට යෝජනාකරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයා කස්තුරි මිය</u>

**පසුගිය පළාත් පාලන වැඩමුළුව තිබ්බා.ඒකෙදි සඳහන් කලා ඉදිරියේදි සියළු පලාත් පාලන ආයතන ප්‍රාදේශිය සභා මට්ටමින් හෙල බොජුන් හල් තියන්න ඕනි කියලා.මම ඉල්ලනවා කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියලා.සෝමරත්න මන්ත්‍රිතුමා කිවා වගේ ඒ යෝජනාවත් මෙකට සම්බන්ධයි. හස්ත, බතික්, හෙල බොජුන් හලට අයිතියි.මල් එකතු කර ගන්න පුළුවන්.දිනකට විශාල ආදායමක් සභාවට ගන්නත් පුළුවන්.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දයා කස්තුරි මිය ගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ හෙල බොජුන් හල ඉදි කිරිම කඩිනම් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>කුරුවිට ප්‍රාදේශි සභාවේ **2022.03.11** දින පැවති මහා සභාවේ</u>
<u>තීරන අංක **05-09** හි උද්ධෘතය</u>

**05-09.** හිග්ගස්හේන කඩ මණ්ඩියේ ප්‍රදාන පාර දෙපස කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කර ගැනීම සඳහා මාර්ග සංවර්දන අධිකාරිය දැනුවත් කිරිමේ යෝජනාව

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයා කස්තුරි මිය</u>

හිග්ගස්හේන කඩ මණ්ඩියේ ප්‍රදාන පාර දෙපස කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කර ගැනීම සඳහා මාර්ග සංවර්දන අධිකාරිය දැනුවත් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
මීට පෙර මෙය සම්බන්ධිකරනයට දැම්මා.මේ වැඩේ අයිති සබාවට කියලා ලිපියක් එවලා.ත්‍රිවිල් පාර්ක් එකේ කැඩුන ස්ලැබ් කැලි දාන්න පෙර පවිත්‍ර කරන්න ඕනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයා කස්තුරි මිය</u>

මම ස්ලැබ් කැලි දාගන්න ඉල්ලිම කලේ .හදල දෙනවා කිවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
මහා මාර්ග වල කානු නඩත්තුව ඒ අයට අයිති.මහජන සෞඛයට අයත් නිසා අපි මැදිහත් වෙනවා.අපි ආර්.ඩී.එකට දන්වලා මේ කටයුත්ත කරමු.ගරු මන්ත්‍රිලා සියළු දෙනා මේ කටයුත්ත කරමු.දිනයක් දාලා කම්කරු කීප දෙනෙක් අරන් කරමු.සාකච්ජා කරලා කරමු.ලේකම්තුමිය මාර්ග සංවර්ධනයට දන්වලා සහාය අරන් අපි මේ කටයුත්ත කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා</u>

මේ කටයුත්ත ටෙන්ඩර් ගන්න කෙනෙක් ඉන්නවා.මුදල් වලට කරන.ඒ අය හරියට කරන්නේ නෑ.අපිට බෑ නෙමේ ගැටළුව.කි.මි.ගානට වසර **5** කට වාර්ෂිකව නඩත්තු කරන අය නොකිරිමයි ගැටළුව.නැත්නම් අපි ගමු නගර පවිත්‍ර ටෙන්ඩරය. අපි ඉල්ලමු.**2023** ඉදන් අපිට දෙන්න ඉල්ලමු.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
හිග්ගස්හේන ඉදන් නගරේ කානු පද්දතිය.ඒ ස්ථාන දෙකත් අපි ඉල්ලමු.සොයා බලා කරමු.දැනට මේ කටයුත්ත කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයා කස්තුරි මිය ගේ යෝජනාව අනුව හිග්ගස්හේන කඩ මණ්ඩියේ ප්‍රදාන පාර දෙපස කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කර ගැනීම සඳහා මාර්ග සංවර්දන අධිකාරිය දැනුවත් කොට සභාය ගෙන දිනයක් යොදාගෙන කාණු පද්ධතිය පවිත්‍ර කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**කුරුවිට ප්‍රාදේශි සභාවේ 2022.03.11 දින පැවති මහා සභාවේ තීරන අංක 05-09 හි සත්‍ය උද්‍ධෘතය ක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**<br>**ලේකම්,**<br>**ප්‍රාදේශිය සභාව,**<br>**කුරුවිට.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා  විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-10.** තලාවිටිය හන්දිය දෙහෙරගොඩ මාර්ගය කාණු පද්ධතිය ගොඩකර සංවර්ධනය කිරීමේ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා

තලාවිටිය හන්දිය දෙහෙරගොඩ මාර්ගය කාණු පද්ධතිය ගොඩකර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා
එම යෝජනාව ස්ථිර කරමි
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා
තලාවිටිය හන්දිය දෙහෙරගොඩ මාර්ගය කාපට් කරලා.කාණු ගැඹුරුයි.වතුර බහින්නේ නෑ.කානුව ගොඩ කරලා නිසා. ජනතාවට පීඩාවක්.මේ කටයුත්ත කඩිනමින් සිදු කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතාගේ යෝජනාව අනුව තලාවිටිය හන්දිය දෙහෙරගොඩ මාර්ගය කාණු පද්ධතිය ගොඩකර සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**05-11.** බඳුවත්ත ගරාජය අසල මාර්ගය සංවර්දනය කිරීමේ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා

බඳුවත්ත ගරාජය අසල මාර්ගය සංවර්දනය කිරීමට  යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්ම ශ්‍රී මහතා
එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මේ සම්බන්ධයෙන් ඉදිරියේ කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතාගේ යෝජනාව අනුව බඳුවත්ත ගරාජය අසල මාර්ගය සංවර්ධනය කිරීමට  ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

යථා පරිදි කල්දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා

**05-12.  පුස්සැල්ල වතුයාය ගල්පුස්සැල්ල හැරෙන හන්දියේ සිට ඉදිරියට පිහිටි පුස්සැල්ල වතුයායේ ඉඩමෙන් අක්කර  එක හමාරක කොටසක් ක්‍රීඩා පිටියක් සඳහා පවරා ගැනීමේ යෝජනාව.**

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ගරු වාසුදේව අමාත්‍යතුමා ලිපියක් ඉදිරිපත්කරලා තියෙනවා.මීට පෙරත් මෙමෙ කටයුත්ත සම්බන්ධව යෝජනා කර ඇතත් එම යෝජනාවේ සඳහන්ව ඇත්තේ වොලිබෝල් ක්‍රීඩා පිටියක් ලෙසයි.ඒ නිසා ක්‍රීඩා පිටියක් ලෙස යෝජනා විය යුතුයි.ඒ අනුව පුස්සැල්ල වතුයාය ගල්පුස්සැල්ල හැරෙන හන්දියේ සිට ඉදිරියට පිහිටි පුස්සැල්ල වතුයායේ ඉඩමෙන් අක්කර එක හමාරක කොටසක් ක්‍රීඩා පිටියක් සඳහා පවරා ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා
**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා     විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව පුස්සැල්ල වතුයාය ගල්පුස්සැල්ල හැරෙන හන්දියේ සිට ඉදිරියට පිහිටි පුස්සැල්ල වතුයායේ ඉඩමෙන් අක්කර  එක හමාරක කොටසක් ක්‍රීඩා පිටියක් සඳහා පවරා ගැනීමට_ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-13. කුරුවිට ,කෙලින් වීදිය ,නො.76 ඒ.එස්.ඒ.මලිත් මහතාගේ, කඩා ඉවත් කල කඩය වෙනුවට තාවකාලික ව්‍යාපාරික ස්ථානයක් ලබා දීමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේ සම්බන්ධයෙන්_ ඒ.එස්.ඒ.මලිත් මහතා විසින් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ඔහු වසර ගනනාවක් කුරුවිට නගරයේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් ඇති අතර (ජෙමිලා කඩේ) කුරුවිට නගර සංවර්ධනය සඳහා ආරම්භක අවස්ථාවේ ව්‍යාපාර ස්ථානය කඩා ඉවත් කර ඇත.ඉන් පසුව සභාව ඉදිකල කඩ කාමරයක් ගත්තද එහි ව්‍යාපාරය පවත්වාගෙන යාමට නොහැකි වූ නිසා එම කඩ කාමරය සභාවට භාර දි ඇත.කඩය වෙනුවෙන් ගෙවූ මුදල්ද ප්‍රාදේශිය සභාවේ තැන්පත්ව ඇත.මේ වන විට කිසිදු ආදායමක් නොමැතිව සිටින බැවින් ව්‍යාපාරයක් කිරිමට සුදුසු තාවකාලික ස්ථානයක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2013.04.30 දිනැති අංක 31453 දරන ලදුපත මගින් රු.889200.00 ක මුදලක් අක් මුදලක් ලෙස ගෙවා ඇත.අදාල රිසිට් පත ඇත. තාවකාලික කඩයකුයි ඉල්ලන්නේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>
**ජෙමිලා කඩය පැරණි කඩයක්.මේ කඩ ඉවත් කරලා තියෙන අයගෙන් මලිත් විතරද ඉතුරු?**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
**තව පිරිසක් ඉන්නවා.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

**මේ කඩ තාවකාලිකව හදාගන්න කියලා දෙන්නේ.ඒත් කාලයක් ගියාම අපේ අධීක්ෂනයෙන් ගිලිහුනාම ස්ථිර වෙනවා.සභාවේ තැන්වල හදනවා කියන්නේ සභා ඉඩමේ හදලාත් දැන් ස්ථිර වෙලා.පුද්ගලික ව්‍යාපාර.මම කොස්ගෙඩිය මන්ත්‍රී කාලේ.කෙසේ වෙතත් තාවකාලික දෙන කඩ ස්ථිර වෙන්න දෙන්න එපා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>

**2009 වර්ෂයේ කඩ කඩන කොට ලොකුම කඩ හිමියා සමූපකාර සංගමය.කුරුවිට විවිධ සේවා සමුපකාර සංගමය. අපි එහි කොටස් කරුවෝ.ඒ කඩත් යම් යම් තැන් වලින් දුන්න.තව දෙන්නත් තියෙනවා.නමුත් නගරයේ හැදෙන ඉඩ එක්කයි දෙන්නේ. 2009 කඩ කඩන කොටයි ජෙමිලා කඩේ කැඩුවේ.ජෙමිලා මුදලාලි කරගෙන ගියේ.මලිත්ට තමා කඩේ අයිති.නමුත් ඒ.ඩී.බී.**

**ගොඩනැගිල්ලෙන් අට ලක්ෂ ගානකට තැනක් දුන්නත් ස්ථානය ව්‍යාපාරයට හරි ගියේ නෑ.රෙදි අලෙවියට.ආපිට කඩේ දුන්නා.මුදල් ගත්තේ නෑ.මේක විශේෂයි.පැරණිම කඩ හිමියෙක්.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුලරත්න ගරු මන්ත්‍රී තුමාත් මේ ජෙමිලා කඩය ගැන දන්නවා.අපිත් දන්නවා.සභා ගිණුමේ බැඳපු මුදලුත් තියෙනවා.දෙන්න කියලා නිශ්චිත තැනක් නෑ.ඒ නිසා_කුරුවිට ,කෙලින් වීදිය ,නො.76 ඒ.එස්.ඒ.මලිත් මහතාගේ, කඩා ඉවත් කල කඩය වෙනුවට තාවකාලික ව්‍යාපාරික ස්ථානයක් ලබා දීමේ යෝජනාව සම්බන්ධයෙන් ඒ සඳහා සුදුසු ස්ථානයක් සොයා බලා ලබා දීමට කටයුතු කිරීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව _කුරුවිට ,කෙලින් වීදිය ,නො.76 ඒ.එස්.ඒ.මලිත් මහතාගේ, කඩා ඉවත් කල කඩය වෙනුවට තාවකාලික ව්‍යාපාරික ස්ථානයක් ලබා දීමේ යෝජනාව සම්බන්ධයෙන් ඒ සඳහා සුදුසු ස්ථානයක් සොයා බලා ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-14. නඩුකාරදෙනිය පදිංචි පි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු 8 දෙනෙකු ගේ වරිපනම් සීමා සම්බන්ධ ගැටළුව විසදාගැනිමට අදාල යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**නඩුකාරදෙනිය පදිංචි පි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු 8 දෙනෙකු ගේ වරිපනම් සීමා සම්බන්ධ ගැටළුව විසදා ගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත.ඒ අනුව මෙම මහතා ඇතුළුව පිරිසකගේ අත්සන් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියෙන් දන්වා ඇති පරිදි වරිපනම් බදු අය කිරීමේදි නිර්නායක පිලිබඳ සොයා බැලීමේදි ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 150 ඇතුලත පදිංචි අයගෙන් පමනක් වරිපනම් බදු අය කරන බව දැන ගන්නට ලැබුණු බවත් නමුත් මෙම පිරිස පදිංචි පුබුදු මාවත පිහිටා ඇත්තේ මිටර් 150 ට වඩා දුරකින් නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර වරිපනම් බදු වලින් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත.ඒ අනුව නඩුකාරදෙනිය පදිංචි පි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු 8 දෙනෙකු ගේ වරිපනම් සීමා සම්බන්ධ ගැටළුව විසදා ගැනිම සඳහා මේ සම්බන්ධ ව තක්සේරු දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කර එම වාර්තාද ලබාගෙන ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව නඩුකාරදෙනිය පදිංචි පි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු 8 දෙනෙකු ගේ වරිපනම් සීමා සම්බන්ධ ගැටළුව විසදා ගැනිම සඳහා මේ සම්බන්ධයෙන් ව තක්සේරු දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කර එම වාර්තාද ලබාගෙන ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-15. නඩුකාරදෙනිය,පුබුදු මාවතේ පදිංචි පි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු 19 දෙනෙකුගේ කසල එකතු කිරිම සම්බන්ධ යෝජනාව .**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
**නඩුකාරදෙනිය,පුබුදු මාවතේ පදිංචි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු පිරිසක් විසින් කසල බැහැර කිරිමට තැනක් නොමැති කම නිසා සභාවේ කසල ට්‍රැක්ටරය එම මාර්ගයේද ගමන් කරවීමට කටයුතු සලසන ලෙස ඉල්ලා ඇත.මේ සම්බන්දයෙන් කාර්මික නිලධාරි හා අනෙකුත් වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා නඩුකාරදෙනිය,පුබුදු මාවතේ පදිංචි.කේ.ඩී.ගුණරත්න මහතා ඇතුළු පිරිස විසින් කසල බැහැර කිරිමට තැනක් නොමැති කම නිසා සභාවේ කසල ට්‍රැක්ටරය එම මාර්ගයේද ගමන් කරවීමට කටයුතු සලසන ලෙස සිදු කර ඇති ඉල්ලිම අනුව මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි හා අනෙකුත් වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-16.කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්ම සකසා ඇති අතර මෙය සියළු දෙනාට වට්ස් ඇප් කලා.වෙන වෙනම මුද්‍රණය කර ලබා දිය නොහැකියි.පිටු හැත්තෑවකට අධිකයි.එසේම මෙමවාර්තා මුල් පිටපත සභා ගත කරමි.මේ සඳහා සභා අනුමැතිය අවශ්‍යයි.ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්ම සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-17 ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශිය සභාවට අත්පත් කරගැනීම සදහා වූ යෝජනාව සම්බන්ධයෙන් ලබා ගත් තීරණය සංශෝධනය කර ගැනීමේ යෝජනාව**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

**ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශිය සභාවට අත්පත් කරගැනීම සදහා වූ යෝජනාව සම්බන්ධයෙන් ලබා ගත් තීරණය සංශෝධනය කර ගැනීමට අවශ්‍යයි.2022.01.08 දින මෙම සභාවේ පැවති මහා සභාවේදි අංක 5-16 යටතේ ගත් තීරනය අනුව ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය මැනුම් කටයුතු කඩිනම් කර ගැනිමට මැදිහත් විමට තීරණය කර ඇතත් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විමසූ විට ප්‍රථමයෙන් මැනුම් සිදු කිරීම අනවශ්‍ය බවත් එමගින් අනවශ්‍ය වියදමක් දැරීමට වන බවත් අත්පත් කර ගැනීමේදි මැනීම් සිදු කරන බැවින් දළ භූමි සටහන අනුව අත්පත් යෝජනාව සකස් කරන ලෙසත් දැනුම් දී ඇත.ඒ අනුව ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශිය සභාවට අත්පත් කරගැනීම සදහා වූ යෝජනාව සම්බන්ධයෙන් ලබා ගත් තීරණය සංශෝධනය කර, ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශිය සභාවට විධිමත්ව පවරා ගැනීමට කටයුතු කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්. ජයරත්න මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශිය සභාවට විධිමත්ව පවරා ගැනීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>05-18</u> එක්නැලිගොඩ පොදු සුසාන භූමිය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

**සිනමාහල පාර ,එක්නැලිගොඩ, අත්වැල්පිටිය යන ගම් ප්‍රදේශ වල මිය යන ජනතාව මිහිදන් කිරිමට ඇති එකම ස්ථානය එක්නැලිගොඩ පොදු සුසාන භූමිය බවත් එහි මිහිදන් කටයුතු වලට වලක් හාරා ගැනිම් ආදි කටයුතු වලදි වර්ෂාව ඇති විට අසීරුතාවට පත් වන බවත් දන්වා ගම් වාසීන් 67 පමන අත්සනින් යුතුව ඉල්ලිමක් කර ඇත. ඒ අනුව සුසාන භූමියේ තිබු ගොඩනැගිල්ල කඩා වැටි විනාශ වි ඇති බැවින් සුසාන භූමියට අළුතින් ගොඩනැගිල්ලක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

**ප්‍රතිපාදන ලැබෙන පරිදි කටයුතු කරමු.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව එක්නැලිගොඩ පොදු සුසාන භූමිය සඳහා ගොඩනැගිල්ලක් ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>05-19</u> එල්ලාවල උප කාර්යාල ට අයත් වරිපනම් විරෝධතා තීරන අනුව දැනුම්දීම සම්බන්ධ යෝජනාව_.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

**2021.10.21 හා 2021.10.22 දෙදින පවත්වන ලද තක්සේරු විරෝධතා පරීක්ෂණය අනුව ලබාදුන් තීරණ අනුව එල්ලාවල උප කාර්යාලයට අයත් වරිපනම් දේපල ඒකාබද්ද කිරීමෙන් පසු ඉවත්වූ දේපල වන, පහත සඳහන් දේපල වලට අදාලව 2022.03.31 දින දක්වා හිඟ ශේෂයන් වන රු.4354.22 හිඟ මුදල් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට යෝජනා කරමි.**

**ඒකාබද්ද කිරීමෙන් පසු ඉවත්වූ දේපල සඳහා වන වරිපනම් අංක හා හිඟ ශේෂ**

| අනු අංකය | විරෝධතා තීන්දු අංකය | වරිපනම් අංකය | දේපල විස්තරය | නම | 2022.03.31 දිනට හිඟ මුදල |
|---|---|---|---|---|---|
| **1.** | **03** | **590/9** | **තේ ඉඩම** | **ඩබ්.උපාලි කරුණාරත්න** | **952.50** |
| **2.** | **13** | **578** | **කඩා ඉවත් කල කඩ කාමරය** | **යූ.ජී.ධර්මදාස** | **734.36 (2020 දක්වා ගෙවා ඇත.** |
| **3.** | **09** | **484/13** | **සනස බැංකුව** | **චමිලා රත්නවීර** | **2667.36** |

**මුළු මුදල රු.4354.22**

<table>
<tr><td rowspan="3">03</td><td rowspan="3">04</td><td rowspan="3">590/9</td><td rowspan="3">රත්නපුර පාර</td><td rowspan="3">4811/=</td><td colspan="5">පහත පරිදි සංශෝධනය කරන ලදී</td></tr>
<tr><td>අභාවිත අංකය</td><td>නව අංකය</td><td>පාර</td><td>දේපල විස්තර</td><td>වාර්ෂික වටිනාකම</td></tr>
<tr><td>560/9<br>599/10</td><td>590/10</td><td>රත්නපුර පාර</td><td>ඇස්බැස්ටස් වහල සහිත නිවස</td><td>34,642</td></tr>
</table>

<table>
<tr><td rowspan="2">09.</td><td rowspan="2">13</td><td rowspan="2">484/13</td><td rowspan="2">රත්නපුර පාර</td><td rowspan="2">13,472/=</td><td colspan="5">පහත පරිදි සංශෝධනය කරන ලදී</td></tr>
<tr><td>අභාවිත අංකය</td><td>නව අංකය</td><td>පාර</td><td>දේපල විස්තර</td><td>වාර්ෂික වටිනාකම</td></tr>
</table>

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 484/14<br>484/13 | 484/14 | රත්නපුර පාර | කොන්ක්‍රීට් වහල සහිත සිල්ලර කඩය | 52,924/= |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | 21 | 578 | රත්නපුර පාර | 22,132/= | පහත පරිදි සංශෝධනය කරන ලදී | | | | |
| | | | | | අභාවිත අංකය | නව අංකය | පාර | දේපල විස්තර | වාර්ෂික වටිනාකම |
| | | | | | 576<br>578 | 576 | රත්නපුර පාර | ඇස්බැස්ටස් වහල සහිත නිවස | 22,132/= |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව එල්ලාවල උප කාර්යාල ට අයත් වරිපනම් විරෝධතා තීරන යටතේ 2021.10.21 හා 2021.10.22 දෙදින පවත්වන ලද තක්සේරු විරෝධතා පරීක්ෂණය අනුව ලබාදුන් තීරණ අනුව එල්ලාවල උප කාර්යාලයට අයත් වරිපනම් දේපල ඒකාබද්ද කිරීමෙන් පසු ඉවත්වූ දේපල වන, ඉහත සදහන් දේපල වලට අදාලව 2022.03.31 දින දක්වා වන හිඟ ශේෂය වන රු.4354.22 මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-20. කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා වැසිකිලිවලක් සකසා ගැනීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-

**කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැසිකිලි වලේ උතුරායාම හේතුවෙන් එම ආයතනය හා මහජනතාව ඉමහත් අපහසුතාවට පත්ව ඇති බවත් වරින් වර ගලි දමා පවිත්‍ර කලත් පසට ජලය අරා නොගැනීමේ තත්වය මත එම කටයුත්ත අසාර්ථක වී ඇති බවත් කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.එසේම එම භූමිය ජාතික ගොඩනැගිලි පර්යේෂන ආයතනය විසින් මධ්‍ය අවධානම් ප්‍රෙද්හයක් ලෙස තහවුරු කර ඇති බවත් නාය අවධානම් අවම කිරීමට පොලොව යටින් විද උපාංග යොදා ඇති අතර ඒ හේතුවෙන් අතර නව වැසිකිලිවලක් සැකසීමට රු.මිලියනයට වඩා වැඩි මුදලක් වැය වන බවත් ඇස්තමේන්තු කර ඇති බව සඳහන් කර ඇත. එහෙත් ප්‍රාදේශිය සභා උප කාර්යාල භූමියේ මායිමට ආසන්නව මෙම වැසිකිලිවලක් හාරා ගැනිමට අවසර දෙන්නේ නම් මේ සියළු ගැටළු වලට විසඳුමක් වන බවත් මෙම කරුණු සලකා බලා මහජනතාවට කාර්යක්ෂම සේවයක් සැලසිමටත් මහජනතාව අපහසුතාවට පත්වීම වැලැක්වීමටත් එසේ වැසිකිලිවලක් සභා භූමියේ ඉදිකරගැනිමට අවසර දෙන ලෙසත් ඉල්ලා ඇත.මේ සම්බන්ධ සියළු තොරතුරු හා වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

**ග්‍රාම නිලධාරි වසම් 17 කින් සමන්විත කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ජනතාව යන එන තැනක්.අපිත් නිතර යන එන තැනක්.සභාවත් සමග මිත්‍ර ශිලි ආයතනයක්.එකට වැඩ කරන ආයතනයක්.ජනතාව දැඩි අපහසු තාවයට පත්වෙලා නිසා මේ අවස්ථාවේ අපි සියළු දෙනාගේ එකත්වයෙන් සහාය වෙමු.සබාවට අයිති ඉඩමෙන් කුඩා ඉඩක් වැසිකිලි වලක් හාරාගන්න දෙමු.**

ගරු ප්‍රාදේශීය සභා.මන්ත්‍රිණී ඩබ්.කේ. තිලකාවති මිය.

**මා සේවය කරන්නේද එම ආයතනයේ.ඉතා දුගඳයි.ජනතාවට කෙසේවත් ඉන්න බෑ. කෙතරම් ක්‍රම යෙදුවත් ගඳ පාලනය කරන්න බෑ.තේ එකක්වත් බොන්න බෑ.මෙ තත්වය මත ජනතාවට සේවය ලබා දිම ට හැකියාවක් නෑ. ජනතාව අසීරු තත්වයට පත් වෙලා.මේ සභාවේ කව්රුවත් මේ ගැටළුව විසදාගන්න විරුද්ධ වේ යැයි මා සිතන්නේ නෑ.එකඟ වෙලා කුඩා ඉඩ ප්‍රමානයක් වැසිකිලි වලක් හාරාගන්න ලබා දෙමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා

**අපේ ඉඩමේ හැදුවත් ඒ ගැටළුව එයිනේ.යාබද ඉඩම. නාය යාමේ අවධානම ඇති.**

ගරු ප්‍රාදේශීය සභා.මන්ත්‍රිණී ඩබ්.කේ. තිලකාවති මිය.

**සභා ඉඩමට ඒ ගැටළුව නෑ.බට දාලා නෑ. කුඩා ඉඩ ප්‍රමානයක් ඉල්ලන්නේ.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-

**කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා වැසිකිලිවලක් සකසා ගැනීමට සභා භූමියෙන් ඉඩ ප්‍රමානයක් ලබා දීම සම්බන්ධව අවශ්‍ය ආයතන වලින් හා අනෙකුත් වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා වැසිකිලිවලක් සකසා ගැනීමට සභා භූමියෙන් ඉඩ ප්‍රමානයක් ලබා දීම සම්බන්ධව අවශ්‍ය ආයතන වලින් හා අනෙකුත් වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-21.කුරුවිට ප්‍රාදේශිය සභාවේ ලේඛනාගාරයේ පැරණි ලේඛණ හා ලිපි ගොනු අපහරනය කිරිමේ කමිටුවට නිලධාරින්ගේ නම්ද ඇතුලත් කිරිම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

**2022.01.18** දින මෙම සභාවේ පැවති මහා සභාවේදී තීරන අංක **05-24** යටතේ කුරුවිට ප්‍රාදේශිය සභාවේ ලේඛනාගාරයේ පැරණි ලේඛණ හා ලිපි ගොනු අපහරනය කිරිමට කමිටුවක් පත් කරගත් අතර එම කමිටුවට නිලධාරීන් ඇතුලත් කර නොමැත. එම හේතුව මත පහත නම් සඳහන් පරිදි ගරු මන්ත්‍රිතුමන්ලා /තුමියන්ලා හා නිලධාරින්ද ඇතුලත්ව අපහරන කමිටුවට පත් කරගැනීමට යෝජනා කරමි.මෙම කටයුතු වෙනුවෙන් දීමනා ලබා නොදේ.

01.ගරු සභාපති ප්‍රේමරත්න මල් කැකුල මහතා
02. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා**
**03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා**
**<u>04.</u> ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේන් මහතා**
05. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය**
06. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය**
07. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී මිය**
08. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා**
09. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා**
**10.ලේකම්-එස්.එච්.ආර්.වීරක්කොඩි මිය**
11.රේණුකා මල්කාන්ති මිය-ප්‍රධාන කලමණාකරන සහකාර
12.ප්‍රසාදි අමරසිංහ මිය-සංවර්ධන නිලධාරි
13.එම්.ඒ.ටී.ශිරන්ති මිය.-කාර්මික නිලධාරි
14.වයි.ඒ.ආර්.පී. යාපා මයා-ආදායම් පරිපාලක
15.තක්ෂිලා හේරත් මිය-සංවර්ධන නිලධාරි
16.නිලානි බෝපිටිය මිය-සංවර්ධන නිලධාරී
17.පී.එම්.ජේ.සල්මියා මිය- කලමනාකරන සහකාර
18.ඉනෝකා සුදර්ශනී මාලා මිය- කලමනාකරන සහකාර

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා

**අපහරන කටයුතු අදාල චක්‍ර ලේඛන අනුව සිදු කරන්න.විනාශ කරන ගොණු ලේඛන පිලිබඳව සභාව දැනුවත් කර සිදු කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ ලේඛනාගාරයේ පැරණි ලේඛණ හා ලිපි ගොනු අපහරනය කිරිමේ කමිටුවට .ගරු සභාපති ප්‍රේමරත්න මල් කැකුල මහතා, **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ධනවර්ධන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩිලාන් රණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි චන්දිම යුරේන් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තුරි මිය ,. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී මිය . ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජීවන් රණතුංග මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි විකසිත පුෂ්පසූරිය මහතා, ඇතුළුව ලේකම්- එස්.එච්.ආර්.වීරක්කොඩි මිය,** රේණුකා මල්කාන්ති මිය-ප්‍රධාන කලමණාකරන සහකාර,ප්‍රසාදි අමරසිංහ මිය-සංවර්ධන නිලධාරි,එම්.ඒ.ටී.ශිරන්ති මිය.-කාර්මික නිලධාරි.වයි.ඒ.ආර්.පී. යාපා මයා-ආදායම් පරිපාලක,තක්ෂිලා හේරත් මිය-සංවර්ධනනිලධාරි,නිලානි බෝපිටිය මිය- සංවර්ධන නිලධාරී,පී.එම්.ජේ.සල්මියා මිය- කලමනාකරන සහකාර.ඉනෝකා සුදර්ශනී මාලා මිය- කලමනාකරන සහකාර යන නිලධාරින් ඇතුලත්ව කමිටුව පත් කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-22. කුරුවිට ප්‍රාදේශිය සභාවේ විගනන හා කලමනාකරන කමිටුව සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් දැනුම් දී ඇති පරිදි නිලධාරින් හා දිනයන් යොදාගැනීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-

කුරුවිට ප්‍රාදේශිය සභාවේ විගනන හා කලමනාකරන කමිටුව සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් දැනුම් දී ඇති පරිදි නිලධාරින් හා දිනයන් යොදාගැනීමට අවශ්‍ය අතර **පහත පරිදි කමිටු සංයුතිය පත් කිරිමටත් පහත සඳහන් දිනයන්හිදි කමිටු පැවැත්විමටත් යෝජනා කරමි.**

**1.කමිටු සංයුතිය**

**1.පළාත් පාලන ආයතනයේ ගරු සභාපති -කමිටු සභාපති**
**2.පලාත් පාලන ආයතනයේ ලේකම් -කමිටු ලේකම්**
**3.පලාත් පාලන ආයතනයේ ගිණුම් නිලධාරි - කමිටු සාමාජික**
**4. පළාත් පාලන ආයතනයේ ආදායම් පරීක්ෂක - කමිටු සාමාජික**
**5. පළාත් පාලන ආයතනයේ විගනන විෂය භාර නිලධාරී - කමිටු සාමාජික**
**6. පළාත් පාලන ආයතනයේ අංශ ප්‍රධානීන් - කමිටු සාමාජික**
**7. වෙනත් අවශ්‍ය නිලධාරින් - කමිටු සාමාජික**
**8. පළාත් පාලන අමාත්‍යාංශයේ**
**ප්‍රජා සංවර්ධන නිලධාරි /විමර්ශන නිලධාරී -කමිටු නිරීක්ෂක**

**9. පළාත් සභා අභ්‍යන්තර විගණන නිලධාරි - කමිටු නිරීක්ෂක**
**10. විගනන දෙපාර්තමේන්තුවෙ නිලධාරින් -කමිටු නිරීක්ෂක**
**11. වෙනත් අවශ්‍ය නිලධාරින් - කමිටු නිරික්ෂක**

**2.කමිටු පැවැත්වීමට නියමිත දිනයන්.**

**1. 2022.03.24 බ්‍රහස්පතින්දා 1 කාර්තුව**
**2. 2022.06.23 බ්‍රහස්පතින්දා 2 කාර්තුව**
**3. 2022.09.22 බ්‍රහස්පතින්දා 3 කාර්තුව**
**4. 2022.12.22 බ්‍රහස්පතින්දා 4 කාර්තුව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**
**එම යෝජනාව ස්ථිර කරමි.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශිය සභාවේ විගනන හා කලමනාකරන කමිටුව සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් දැනුම් දී ඇති පරිදි ඉහත සඳහන් නිලධාරින් හා කමිටුව පැවැත්විමට ඉහත දිනයන් යොදාගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-23** . කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදාහනාගාර සේවකයන්ට හා සභාවේ කම්කරුවන්ට නිල ඇඳුම් ලබා දිමට ගරු ආන්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනිම සම්බන්ධ යෝජනාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

**2021.09.26 දින කුරුවිට ප්‍රාදේශිය සභාවෙ පැවති කාර්ය මණ්ඩල රැස්වීමේදි පුස්සැල්ල අදාහනාගාරයේ සේවයේ නියුතු සේවකයන්ට සුදු පැහැති නිල ඇඳුමක් සහ අනෙකුත් කම්කරුවන්ට කාකි පැහැ නිල ඇඳුමක් ලබාදිමටත් කුප්‍රාස නාමය සහිත කබායක් හා බූට්ස් යුගලක් ලබාදීමටත් තීරනය කරන ලදී.**

**ඒ අනුව 2021.04.09 දින මහා සභාවේදි මෙම තීරනය ඒකමතිකව සම්මත විය.**
**මෙම කටයුත්ත සිදු කිරිමට පලාත් පාලන කොමසාරිස් අනුමැතියට යැවුවද මේ සඳහා සභා අරමුදලින් වැය බර දරන්නේ නම් ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු බව දන්වා ඇත.එබැවින්** කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදාහනාගාර සේවකයන්ට හා සභාවේ කම්කරුවන්ට නිල ඇඳුම් ලබා දිමට සභා අරමුදල් යෙදවීම සම්බන්ධයෙන් ගරු ආන්ඩුකාර තුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු නිල ඇඳුම් ලබාදීමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදාහනාගාර සේවකයන්ට හා සභාවේ කම්කරුවන්ට නිල ඇඳුම් ලබාදීමට හා අරමුදල් යෙදවීම සම්බන් ධයෙන් ගරු ආන්ඩුකාර තුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු නිල ඇඳුම් ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-24. එල්ලාවල උප කාර්යාල දේපල සංශෝදනය යටතේ පි.ඒ.පොඩිඅප්පුහාමි මයා විසින් සිදු කර ඇති ඉල්ලීම සම්බන්ද යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-

**කුරුගම්මෝදර පාර වම් අත පැත්ත වරිපනම් අංක 129 හා 129/1 පී.ඒ.පොඩිඅප්පුහාමි (හි.කි.)පි.ඒ. කුලවති (හි.කි.)ලෙස සඳහන් දේපලෙහි වරිපනම් අංකය සංශෝධනය කර 129 ලෙස කුප්‍රාස KPS/RE/01 හා 2020/10/01 දිනැති ලිපිය මගින් අයිතිකරු වෙත දන්වා ඇත.**
**ඒ අනුව වරිපනම් සංශෝධනය කිරිම සඳහා අයිතිකරු විසින් 2017.07.20 දිනැති අවසන් නිවේදනය අනුව රු. 10046.25 ක මුදලක් වාරික වශයෙන් ගෙවූ බවට දැනුම් දී ඇත.අදාල ලිපි වරිපනම් සංශෝධනයට භාර දුන් බව සඳහන් කර ඇතත් එම ලිපියට පිලිතුරු ලැබී ඇත්තේ 2020.10.01 දිනයි.ඒ අනුව 2017.වර්ෂයේ සිට 2021.12.31 දිනට වරිපනම් අංක 129 හි හිඟ මුදල ලෙස රු.10036.32 ක මුදලක් ලේඛණවලට අනුව ගෙවීමට සඳහන්ව ඇති බැවින් 2022.02.14 දිනැති ලිපියෙන් වන ඉල්ලීම පරිදි මෙම හිඟ මුදල කපා හරින ලෙස ඉල්ලා ඇත.**

**ඒ අනුව මෙම 2017 වර්ෂයේ සිට 2021.12.31 දිනට වරිපනම් අංක 129 හිග මුදල වන රු.10036.32 මුදල ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
**කුරුගම්මෝදර පාර වම් අත පැත්ත වරිපනම් අංක 129 හා 129/1 පී.ඒ.පොඩිඅප්පුහාමි (හි.කි.)පි.ඒ. කුලවති (හි.කි.)ලෙස සඳහන් දේපලෙහි 2017 වර්ෂයේ සිට 2021.12.31 දිනට වරිපනම් අංක 129 හිග මුදල වන රු.10036.32 මුදල ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-25 ග්‍රාමීය ක්‍රිඩා පිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ මාටුවාගල ක්‍රීඩා පිටියේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරිම සම්බන්ධ යෝජනාව.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

ග්‍රාමීය ක්‍රිඩා පිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2022 යටතේ කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමිය ක්‍රිඩා පිටි සංවර්ධන වැඩසටහන සඳහා මාටුවාගල ක්‍රිඩා පිටියේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරිමට යෝජනා කර ඇති බවත් එම යෝජනාව සඳහා සභා එකගතාවය ලබා දෙන ලෙසත් ප්‍රාදේශිය ලේකම් කිරිඇල්ල විසින් ඉල්ලීමක් කර ඇත.අදාල ඇස්තමේන්තු පිටපතක්ද ඉදිරිපත් කර ඇත.ඒ අනුව ග්‍රාමීය ක්‍රිඩා පිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2022 යටතේ මාටුවාගල ක්‍රීඩා පිටියේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරිමට මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මාලනි පීරිස් මිය</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා ප්‍රාදේශිය ලේකම් කිරිඇල්ල 2022.02.17 දිනැති ඉල්ලීම අනුව** ග්‍රාමීය ක්‍රිඩා පිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන 2022 යටතේ මාටුවාගල ක්‍රීඩා පිටියේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**කුරුවිට ප්‍රාදේශි සභාවේ 2022.03.11 දින පැවති මහා සභාවේ තීරන අංක 05-26 උදෘතය**

05-26 කුරුවිට ප්‍රාදේශිය සභාව සතු RC-6949 අංක දරන කැබ් රථයේ අනතුරට අදාල රක්ෂන වන්දිය සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

සභාව සතු RC-6949 අංක දරන කැබ් රථයේ අනතුරට අදාල රක්ෂන වන්දි මුදල ලබා දිමට නොහැකි බව රක්ෂන සංස්ථාව විසින් දැනුම් දි ඇත.එයට හේතුව ලෙස සදහන් කරනුයේ අනතුර සිදුවන අවස්ථාවේ රියදුරු බීමතින් රියපැදවිමයි.කෙසේ වුවත් නඩුවේදි රියදුරුට අලාභය ගෙවිමට සිදු වනු ඇත.ඒ නිසා නඩු තින්දුව අනුව කටයුතු කරමු. එතෙක් අපි ට්‍රැක්ටරය හදනවා.එය දිරාපත්වෙයි.එසේම කසල ට්‍රැක්ටරය අත්‍යාවශ්‍යයි.ඒ නිසා අනතුරට පත් සභාව සතු RC-6949 අංක දරන කැබ් රථය අළුත්වැඩියා කිරිමට ත් ඉදිරි නඩු තීන්දුව අනුව කටයුතු කිරිමටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
කුරුවිට ප්‍රාදේශිය සභාව සතු අනතුරට ලක්වූ RC-6949 අංක දරන කැබ් රථය අත්‍යාවශ්‍ය හේතුන් මත අළුත්වැඩියා කිරිමට ත් ඉදිරි නඩු තීන්දුව අනුව කටයුතු කිරිමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**කුරුවිට ප්‍රාදේශි සභාවේ 2022.03.11 දින පැවති මහා සභාවේ තීරන අංක 05-26 හි සත්‍ය උදෘතය ක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

05-27-ඇස්තමේන්තු

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

05-27-1 සිට 05-27- 23 දක්වා පහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් යෝජනා කරමි.

05-27-01 දෙල්ගමුව ගැමුණු ක්‍රිඩා පිටිය ඉදිරිපිට මාර්ගය
සංවර්ධනය කිරිම රු.400000.00
05-27-02 දෙල්ගමුව පුනරුත්ථාපන කඳවුර ඉදිරිපිට මාර්ගය සංවර්ධනය රු.600000.00

05-27-03සෙරමික් හන්දිය කුරුඳු කොටුව මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම
රු.150000.00

05-27-04. මිල්ලවිටිය මැලේ බැද්ද හේන මාර්ගය කොන්ක්‍රිට් කිරිම රු.1110000.00
05-27-05 මිල්ලවිටිය කබරයා විත අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම රු.110000.00
05-27-06 මිල්ලවිටිය කනත්ත අසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම රු.110000.00

05-27-07 පැරඩයිස් නව ජනපදය ප්‍රජා ශාලාව පාර ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම
රු.915000.00
05-27-08 කොස්ගොඩ ප්‍රජා ශාලාව උඩ පාර ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම

රු.170000.00

05-27-09 පාතගම දුම්මලේ ගොඩ මංජුල මහතාගේ නිවස අසල සිට උපාලි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිම (සංශෝධන) රු.1112888.24

05-27-10 කරපිංච පාතගම පළාත් මාර්ගයේ සිට කැන්ද ලන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරිම සංශෝධන) රු.674540.35

05-27-11 මැල්වත්ත මාර්ගයට හානි වු ස්ථානයේ පැති බැම්ම හැදීම (සංශෝධන) රු.410000.00

05-27-12 ගල්පුස්සැල්ල ට්‍රාන්ස්පොමරය ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම සංශෝධන) රු.680000.00

05-27-13. කදන්ගොඩ වරකා දෙනිය ඇල හරහා හුන්නානමුල්ලදක්වා ඉතිරි ඇල කොටස කපා සංවර්ධනය කිරිම- රු.700000.00

05-27-14 ගංවතුරෙන් යටවන හිදැල්ලන සිට කොස්ගොඩ ඇල දක්වා මහා ඇල කපා පළල් කර සංවර්දනය කර ප්‍රෙද්ශය ජලයෙන් යටවී වැලැක්විම රු.1000000.00

05-27-15 මැරේ කැලේ ආරණ්‍ය සේනාසනයට පිවිසෙන මාර්ගයේ පැතිබැම්ම බැඳිම-රු.415000.00

( ගරු සභාපතිතුමා)

05-27-16 එක්නැලිගොඩ විද්‍යාලය අසලින් අතුරුපාර කොන්ක්‍රීට් කිරිම-රු.29500.00
(ගරු ප්‍රාසම ආර්.සෝමරත්න මහතා)

05-27-17 හල්පෙ සමගි මාවත ජල යෝජනා ක්‍රමය ට විදුලිය ලබා දීම -රු.100000.00

05-27-18 අගල කපාපු වත්ත පාර සංවර්ධනය කිරිම -රු.300000.00
(ගරු ප්‍රාසම ආර්.සෝමරත්න මහතා)

05-27-19 පුස්සැල්ල නෙළුගොල්ල අතුරු මාර්ගය සංවර්ධනය කිරිම -රු.450000.00

**05-27-20 කිරිඇල්ල අත්කම් නිවාස පාර කොන්ක්‍රීට් කිරීම -රු.400000.00**

**05-27-21 ගෝනමඩිත්තහේන පාර කොන්ක්‍රීට් කිරීම -රු.600000.00**
(ගරු ප්‍රාසම ශානක දර්ශන මහතා)

05-27-22 කාහේන්ගම වැළිහිඳ පාර පැතිබැම්ම බැදීම 2 අධියර -රු.265000.00
( විසල් රත්නපුර)

**05-27-23 මියනදෙනිය මැදවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම -රු.200000.00**
(ගරු ප්‍රාසම ධනංජය වීරසේකර මහතා)

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
05-27-1 සිට 05-27- 23 දක්වා ඉහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-28. කුරුවිට ප්‍රාදේශිය සබාවේ වාණිජ ගොඩනැගිල්ල ඉදි කිරිම (ටයිප් 1) වැඩ අවසන් බිල ගෙවිම සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

මෙම කර්මාන්තය සඳහා වැඩ කුරුවිට ප්‍රාදේශිය සභාවේ වැඩ අවසන් බිල ගෙවීමේදි බිල අඩුවෙන් ගෙවා ඇති බව එල්.පී.කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් ලිඛිතව දන්වා ඇති අතර කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන පළාත් ඉංජිනේරු මහතා විසින් වැඩ අවසන් බිල ගෙවීමේදි රු.8370.94 ක මුදලක් අඩුවෙන් ගෙවා ඇති බව දන්වා එවන ලදි.එම අඩු මුදල වන රු.8370.94 ක මුදල එල්.පී.කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවන ලෙස ඉල්ලා ඇත.මෙය ප්‍රමාද දෝෂයකින් සිදුවී ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

කිරිඇල්ල පොදු වෙළඳ පල ගැන හැම සභාවේම කතා කරනවා.හැම සභාවේම කොටස් ගෙවනවා. ඉංජිනේරුවන් එක එක වෙනස්කම් කරනවා. අපිට මේ පිළිබඳ ප්‍රසාදයක් නෑ.ඇත්තටම මේකෙ අප්‍රසාදය එන්නේ සභාවට.අද වුනත් ක්‍රියාත්මක වෙන්නේ මේ සභාවේ මුලින් අනුමත කල ක්‍රමවේද නෙමේ. ඉවර කරන්න කීවා.මිදුල නෑ.උඩ හදනවා.ආයේ මිදුල වෙනම හදන්න ඕනි.අපිට විනිවිද භාවයක් නෑ. අවබෝධයක් නැතිව යනවා. මේ අසාධු ලේඛන ගත වෙන අය.වැඩ හොඳ නම් කමක් නෑ.මහජන මුදල් .ඇත්තටම අප්‍රසාදයක් පවතින්නේ.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

මේ ව්‍යාපෘතිය සබරගමු පළාත් සභාවේ ඉංජිනේරු කාර්යාලය මගින් කෙරෙන්නෙ.අපේ කිසිම බිල් ලිපි කටයුතු නෑ.සබරගමු පළාත් සබාව කරන්නේ.ඒ ඉංජිනේරු මහතා තමා කියන්නේ මේ හිඟයක් ඇති බව.අපේ කාර්මික නිලධාරීට මේවා කරන්න බෑ. විධායක කාර්යාලය කරන්නේ. පළාත් පාලන ආයතනයට සීමා තියෙනවා. පළාත් සබාව කරන කර්මාන්තය ගැන දැනුම් දුන්නේ ඒ අයමයි.මිදුල මුදලින් උඩ හදන්නේ.හේතුව කඩ 10 .තව එක් අයෙකුට කඩයක් අඩුයි.නොතාරිස්, සැලූන් වගේ දෙන්න පුළුවන්.උඩ කඩ හදන්නෙ නමුත් මිදුල හදනකම් පවත්වාගෙන යන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

ගනන් ටික නිවැරදිව හදන්න අවශ්‍යයි.නිවැරදිව කරන්න කියන්න.වැඩ නිම කරන්න ඕනි.

31 නිම කරන්න ඕනිනේ.මාර්තු 31 බිලට ඒ මුදල ගෙවන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ඉංජිනේරු මහතුන් වෙන වැරදි වැඩ කරන්නේ නෑ.සුළු අත්වැරදීම් වෙන්න පුළුවන්.මේ වැරදි නිවැරදි කරමු. කුරුවිට ප්‍රාදේශිය සබාවේ වාණිජ ගොඩනැගිල්ල ඉදි කිරිම (ටයිප් 1) වැඩ අවසන් බිල ගෙවිමේදි රු.8370.94 ක මුදලක් අඩුවෙන් ගෙවා ඇති බව පළාත් ඉංජිනේරු මහතා විසින් දැනුම් දී ඇති අතර රු.8370.94 ක මුදලක් අවසන් බිල ගෙවීමේදි එල්.පී.කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව
කුරුවිට ප්‍රාදේශිය සබාවේ වාණිජ ගොඩනැගිල්ල ඉදි කිරිම (ටයිප් 1) වැඩ අවසන් බිල ගෙවිමේදි රු.8370.94 ක මුදලක් අඩුවෙන් ගෙවා ඇති බව පළාත් ඉංජිනේරු මහතා විසින් දැනුම් දී ඇති අතර එම අඩුවෙන් ගෙවා ඇති රු.8370.94 ක මුදල අවසන් බිල ගෙවීමේදි එල්.පී.කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-29 -2022 වර්ෂයට ආදායම් පරීක්ෂක නිල ඇඳුම් දීමනාව ඉල්ලීම සම්බන්ධ යෝජනාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුරුවිට **ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක වරුන් දෙදෙනා හට නිල ඇඳුම් දීමනාව** 2022 වර්ෂයට **ලබාදෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව එක් අයෙකු හට රු.19300.00 වන පරිදි එක් මිල ගනනක් ඉදිරිපත් කර ඇති අතර අදාලරු.19300.00 දීමනාව ඉල්ලා ඇත.මේ සම්බන්ධයෙන් රාජය පරිපාලන චක්‍රලේඛ 22/2001 අනුව ඉල්ලා ඇති අතර අදාල නිල ඇඳුම් දීමනාව වන රු.19300.00 ක මුදල නීත්‍යානුකූලව ලබා දීමට යෝජනා කරමි.එසේම මෙම නිල ඇඳුම් පැළඳ සිටීම අවශ්‍යයි.සභාව දිනදී මෙම ඇඳුමින් සිටින ලෙසද ඔවුන්ව දැනුවත් කරන්න.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා කුරුවිට **ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක වරුන් දෙදෙනා ගේ ඉල්ලීම අනුව ආදායම් පරීක්ෂක නිල ඇඳුම් දීමනාව** 2022 වර්ෂයට **ලබාදෙන ලෙස ඉල්ලා ඇති අතර එක් අයෙකු හට රු.19300.00 වන පරිදි ඉල්ලා ඇති රු.19300.00 දීමනාව රාජය**

**පරිපාලන චක්‍රලේඛ 22/2001 අනුව නීත්‍යානුකූලව ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**06.කාරක සභාවල වාර්තා**

06-01 මුදල් කමිටු වාර්තාව(2022.03.07)

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**2022.03.07 දින මුදල් කමිටු වාර්තාවේ අංක 29 යටතේ සබාවේ අදාහනාගාරයේ ගෑස් බිල සම්බන්ධ නිර්දේශය ඇතුලත් විය යුතුයි.එය මුද්‍රන දෝෂ ප්‍රමාදයකින් ඇතුලත්වි නැති අතර විස්තර පහත පරිදි වේ.**

| බිල් අංක | ගාස්තුව |
|---|---|
| **132166-22.02.15** | **රු.43965.00** |
| **132167-22.02.21** | **රු.43965.00** |

**මෙම බිල් දෙක සඳහා පැරණි බිලට වඩා එක් බිලකට රු.1250.00 කින් වැඩිවි ඇති අතර මෙම මිල ගනන් පවතින මිල ගනන් වෙනස් විම මත වැඩිවි ඇත.ඒ අනුව රු.87930.00 ක මුදල ජේ.කේ.එන්ට්‍රප්‍රයිසස්වෙත ගෙවිමට මුදල් කමිටු නිර්දේශය ලැබුන බව ට සටහන් වි යුතුය.මෙය අත්‍යවශ්‍ය සේවාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් වාර්තාවට ඇතුලත් කරන්න.**

22.03.07 දින මුදල් කමිටු වාර්තාව සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා :-

22.03.07 දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී මානෙල් කරදන මිය-

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 22.03.07 **වන දින මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව (2022.02.18)

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

22.02.18 දින **කාර්මික කමිටු වාර්තාව** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>**

22.01.12 දින කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී චන්ද්‍රලතා බණ්ඩාර මිය-</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 22.01.12 දින කාර්මික කමිටු වාර්තාව **සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(2022.02.21)

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(2022.02.21) සභාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කර ඇත.

**07 <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

07-01 -2022 ජනවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

2022 ජනවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx2022 ජනවාරි මස මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx

07-02 2022 පෙබරවාරි මස ගෙවීම් වාර්තාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 පෙබරවාරි_මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-**

2022_පෙබරවාරි_මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා :-**

නිලධාරී ගෙවීම් සමහර ඒවා පිලිගන්න බෑ.ඉරිදා කාර්යාලයට ඇවිත් ලිපිද්‍රව්‍ය ගෙන යාම .එහෙම විවෘත කරනවද?සංයුක්ත දිමනාව නිර්වචනය නිවැරදිව ගන්න.චක්‍රෙල්ඛය අනුව පිට දවසක් ඉන්න ඕනි. කි.මී.7ට වඩා දුරින් ඉන්න ඒනි.අපි අනුමත කලා කියන්නේ දන්නෑ කියන එක.මුදල් ගෙවීම් ගැන සැලකිලිවෙන්න. පලාත් පාලනමුදල් කියන්නේ රජයේ මුදල්.රටට උන දේ ආයතනයට උනොත් වසර ගානක් කල දේ වැඩක් නැතුව යනවා.මේ හැකිතාක් ඉතුරු කරන්න.අතිකාල ගෙවීම් සොයා බලන්න.මම වැරදිද දන්නේ නෑ.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

සංයුක්ත දිමනා පැය 12 ක් සම්පුර්න වුනාම ගෙවන්නේ.වැටුප් තලය අනුව.භාන්ඩ සමීක්ෂන දිමනා තියෙන්නේ. රු.4000.00. එය චක්‍රෙල්ඛ අනුව ගෙවිමක්.සියළු අනුමැති සහිතවයි. ගෙවලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේන් මහතා :-**

සංයුක්ත දීමනා අතිකාල සීමා කරන්න. මේ යන විධහට අතවශ්‍ය දේ පමනක් කරන්න.මුදල් ඉතුරු කරන්න.සීමා කරන්න.ඇත්තටම වැඩ කරන අයට විතරක් දෙන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

මාත් හිතනවා මේ දුෂ්කර වෙලේ ආර්ථිකය රැකගත යුතුයි.වියදම් අඩු කල යුතුයි.බෝපත් ඇල්ල එන්නේ වාහන කීපයයි.ඒ ඉන්න සේවකයා අතිකාල ගන්නවා.මේ අතිකාල නැතිව කරන්න ක්‍රම

වේදයක් හදන්න.සුදුසු ක්‍රම හදන්න.එසේම මේ ගෙවීම් වාර්තාව ගැන ඉදිරියේදි සොයා බලා කටයුතු කරමු.අදත් සභාවේ සංවර්දනවැඩට වියදම් කරන්න බැරි තත්වයක් තියෙන්නේ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** 2022 පෙබරවාරි_මස ගෙවීම් වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08.වෙනත් කරුණු.

**08--01**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

**කුරුවිට නගරය ආසන්නයේ බිම් කොටස් කීපයක් රන්හවඩියගේ වත්තහෙවත් මහදූරයාගේ වත්ත. නමින් ඇති අතර එහි බිම්කොටසක් පර්. 1ක් ලක්ෂ 3ට වැඩියි. රත්නපුර දිසා අධිකරනයේ 2009.සැප්.01 දින පිඹුරු අංක 531 හි මෙහි බිම් කොටස් 2ක් සභාවට වෙන් කර ඇත. එම පිඹුර සභා ගත කරමි. දැනුවත් කලේ මෙම ඉඩම් කොටස සම්බන්ධව ක්‍රියා කරන්න.පොදු කටයුතු වලට වෙන් කල කොටස.මෙම බිම් කොටස් මුඩු තත්වයේ තියෙන්නේ. මේ කොටස ආක්‍රමනය කරමින් පවත්න්නේ.මේවා හතර මායිම් මැනලා.සභාව සතු බව තහවුරු කරමු.කැබලි අංක 45 දැන් එක් අයෙක් පස් පුරවලා.මේ ඉඩම් ගැන සොයා බලා කටයුතු කරන්න.ග්‍රාම නිලධාරි හා මැදිහත් වෙලා වාර්තා අරගෙන මේ ඉඩම් ගන්න. අනාගතයට ඉතා වටිනවා.**

**08-02**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

**මම කුරුවිට නගරය වෙනුවෙන් අවුරුදු 11 ක් උසාවි ගියා.පොලිසි ගියා.නගරය හදන්න. ඒත් හොඳක් අහන්න ලැබෙන්නෙ නෑ. නගරයේ වැසිකිලි වල පිරෙනකොට ගලියට ක්‍රම වේදයක් හැදුවා බයෝසෙල්.නමුත් ඒක අසාර්ථකයි.ගඳයි.නගරයේ මන්ත්‍රි ලෙස මේක මට ලොකු ගැටළුවක්.ජනතාව මටත් එක්කයි කියන්නේ. මම කීවා සභාපතිතුමාට මේක.කාර්මික නිලධාරිට කිවා.ඒ සම්බන්දව මම දැනුවත් කලා කියලා කාර්මික නිලධාරි මට විරෝධයක් පෑවා.මම කලේ මගේ යුතුකම.මගේ ව්‍යාපාරික හිතවතුන් වත් තරහා ආවා.මහජන මුදලින් වැටුප් ගන්න සේවකයන් නිවැරදිව තම රාජකාරිය කරන්න අවශ්‍යයි කියන එකයි. මම කීවේ.නමුත් මට වේගයෙන් කතා කලා. මම මට හිමි තැනටයි මේ කියන්නේ.සබාවට.මම බය නෑ.මම**

**කාගෙන්වත් යැපිලා නෑ. වැසිකිලිය සම්බන්ධයෙන්අක්‍රමිකතා සිදුවී ඇත. මෙය අසාධාරන වන අතර ජනතා ගැටළුවකි.ජනතා පරමාධිත්‍ය වෙනුවෙන් අසාධාරනයට විරුද්ධ වෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා :-</u>

**මහජන නියෝජිතයින්ට එසේ කතා කරන්න බෑ. විනය පරීක්ෂනයක් තියන්න.නිවාස සැලසුම් අනුමත කරන්න ජනතාව ආවාම ඒවා නිවැරදි නෑ කියලා තමන් අරන් ඇදලා පාස් කිරිම වැරදියි.ජනතාව දැඩි අපහසුතාවට පත් වෙන්නේ. ගිවිසුමක් ඇති වැසිකිලියේ බයෝ සෙල් එක ට.අසාර්ථක නම් ඒ ගිවිසුම අනුව කටයුතු කරන්න. පරීක්ෂනයක් කරන්න. එසේම මහජන නියෝජිතයන්ට එසේ ප්‍රසිද්ධියේ කතා කල නොහැකියි. මේ අභිබවා යාම තුලින් වැරදි ආදර්ශයක් වෙන්නේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති විජේසිරි මහතා :-</u>

**1991 සිට සභා සංයුතිය තුල මාත් හිටියත් මෙවැනි දෙයක් වෙලා නෑ.යම් යම් එකගතා පරස්පර වුනත් මෙවැනි සිද්ධි හරි නෑ.කනගාටුව ප්‍රකාශ කරමි.නගරයේ අඩුපාඩු පෙනෙන්නේ නගරයේ මන්ත්‍රිට වැඩිපුරම. ඉදිරියේ මෙවැනි සිද්ධි නොවන ලෙස කටයුතු කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනී මිය :-</u>

**මෙම ගරු මන්ත්‍රි තුමා අපහසුතාවයට පත් විම පිලිබද ක්‍රියාමාර්ග ගන්න.අපිත් ගරු කරනවා එතුමාට.කාන්තා මන්ත්‍රිතුමියන්ලාටත් මෙවැනි දේ වෙන්න පුළුවන්.විනය පරීක්ෂනයක් තියන්න.නිලධාරින් සේවා ස්ථාන මාරු කරලා ගියත් මහජන ගැටළු වලට උත්තර දෙන්න ඕනි මන්ත්‍රි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති විජේසිරි මහතා :-</u>

**ගරු මන්ත්‍රිතුමිය කීව ලෙස අවු 25 ක් මෙතුමා අපරාජිතව සභාවේ හිටියා කියන්නේ.ජනතාවගේ විශ්වාසයයි.ජනතාව වෙනුවෙන්, නගරය වෙනුවෙන් පෙනී හිටියා.වැසිකිලිය නගරයට විතරක් නෙමේ බල ප්‍රෙද්ශයටම ගැටළුවක්.නිලධාරින් ගෙන් එසේ තර්ජන බෑ.ජනතාවගේ සමච්චලයට පත් වෙනවා.ඒ උනාම ගැටළු.මේ තත්වය වැරදියි.මේ දේ ගැන සොයා බලා පියවර ගන්න. අපි සියළු දෙනාම අනුමත කරනවා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේෂ් මහතා :-</u>

අද උදේ සුනඛයෙක් පාරේ මැරිලා.ඒ ඉදිරිපිට කඩ හිමියා කියනවා මේ කුණු ගන්න කීවාම වරිපනම් ගෙවලද අහනවළු.ඒක අහන්න ඕනිද?අපි මේ නිලධාරින්ගේ අතිකාල සොයන්නේ නැ.අනුමත කරනවා.ඒ ජනතාවගේ මුදල්. නිලධාරි ඒක හිතන්න ඕනි.අයිතිවාසිකම් භුක්ති විදිනවා වගේම යුතුකම් කරන්නඕනි.නිල ඇඳුම් දෙනවා ඇත්තටම අදින්න ඕනි.දෝෂය

ඔබතුමාට.මේ සෝමරත්න මන්ත්‍රීතුමාගේ ගැටළුව පිළිබද සභාව ඉදිරියට ඇවිත් සමාව ගත යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**

සභාවට අයත් ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පිළිබදව ගැටළුවක්.නඩු එපා. මායිම් වැට ගහලා වෙන් කර ගන්න.නඩු දැම්මොත් නීත්‍යානුකූලව පැවරුවා වගේ.වටිනා ඉඩම් සොයා බලා කටයුතු කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>**

පළාත් පාලන ආයතනයක නිලධාරීන් මහජන නියෝජිතයන් සුහද නැත්නම් එය බරපතල ගැටළුවක්. ගැටුම් නම් විනාශයක්.නිලධාරීන් මහජන නියෝජිතයන් කෙරේ අවධානය දීලා කටයුතු කරන්න ඕනි.යුරේන් මන්ත්‍රී තුමා කීවා වගේ වරිපනම් ගෙව්වද අහන්න ඕනි නෑ.අහනවා කියන්නේ දන්නෑ කියන එක.සමහර වැඩ සබාවේ ඉදිරියට යන්නෙ නෑ.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

වැසිකිලියේ බයෝ සෙල් ක්‍රමය අසාර්ථක වීම මටත් දැනුම් දුන්නා.වචන හුවමාරුවක් උනා.කනගාටුව ප්‍රකාශ කරනවා.සහෝදර මන්ත්‍රීලත් එකඟයි.ලේකම්තුමිය කාර්මික නිලධාරි විමසලා මේ පිළිබද ඉදිරි කටයුතු කරන්න.

8-2 **<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

මෙම සභාවේ කාර්මික කමිටුව 2022.03.07 දින පැවැත්වීමට නියමිතව දැනුම් දී ඇතත් සාමාජිකයන් නොපැමිනිම මත නොපැවැත්වූ බව දැනුම් දි ඇත.මෙම කමිටුව පැවැත්වීම අත්‍යවශය නිසා කවුරුත් සාමාජිකයන් සහභාගි වෙන්න.

8-3 **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**

ටෙන්ඩර් ආවාම විස්තර බලනවද?ගිය වර ලිපිද්‍රව්‍ය වලට ලොකු ලැයිස්තුවක්.අඩු මිලට ගන්න කීවේ.ඒ මුළු එකතුවෙන් නොවේ.සෑම මිල ගනනනකම ඇති අඩුම මිලෙන් අයිතමය අනුව අඩු එකයි ගන්න ඕනි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

ඉදිරියේදි එසේ කරමු.අඩුම මිල අයිතමය අනුව ගමු.

8-4 **<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

2022.අප්‍රියෙල් අවුරුදු උත්සව අත්තිකාරම් ලබා දිම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ අත්සන් සහිතව ඉල්ලිමක් කර ඇත.විගනනය ගැටළුවක් තිබුනත් මේ පිලිබඳ සොයා බලා කටයුතු කරමු.රු.10000.00 දීමට හැකියාව ඇත්නම් කටයුතු කරමු.

8-5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති විජේසිරි මහතා :-

කඩ ගැටළුව .මේ සම්බන්ද තත්වය කුමක්ද? වාර්තාවක් දුන්නනෙ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

තාම දීලා නෑ.අසනීප විම නිසා ඒ ගැන සානච්ජා කිරිමට බැරි උනා.අදාල පාර්ශවය හා දිනයක් යොදාගෙන කතා කරමු.

08-06 - කුරුවිට ප්‍රාදේශීය සභාවේ බුදු මැදුර සඳහා බුදු පිළිම වහන්සේ නමක් පූජා කිරීම

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ පුස්ථකාල සඳහා ගරු එච්.කේ.එම්.එස්.එස්.ධනවර්ධන මන්ත්‍රීතුමා පුද්ගලික මුදල් යොදවා විශාල පොත් පරිත්‍යාගයක් කලා.එසේම ගියවර සබාවේදි කීපරිදි කම්කරුවන්ට නිලඇඳුම් ලබා දිමට කටයුතු සලසා ඇත.දැන් එතුමා තවත් උතුම් ක්‍රියාවක් සිදු කරන්න කටයුතු කරනවා.සභාවේ බුදු මැදුරට බුදු පිළිමයක් පූජා කරනවා.එතුමන්ගේ මැනියන්ට පිං පිනිස මේ කටයුත්ත කරන්නේ.මේ පිං බලය එතුමන්ගේ මැනියන් ට අනුමොදන් වේවා. එසේම මේ පිනෙන් මෙතුමන්ගේ ඉදිරි ජීවිත කටයුතු සියල්ල හැම අතින්ම සාර්ථක වේවා.කියා පතනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

මාගේ මන්ත්‍රි ධුර කාලයේ මා දුටු ආදර්ශවත්ම මන්ත්‍රිතුමා මෙතුමායි.ඉතා ඉහලින් අගය කරනවා.මේ කාලයේ සිටින ඉතා ම යහපත් මන්ත්‍රිතුමෙක්. කම්කරවන්ට දෙන නිල ඇඳුම පිලිබද මාත් ලේකම් තුමියත් සැලසුම් කලා.හොඳම ත්ත්වයේ ඇඳුමක්.මේ බුදු පිලිම පූජාව.එතුමන්ගේ මැනියන්ට පිං පිනිස.එතුමියට නිවන් සුව අත්වේවාතමෙතුමාගේ මෙලොවත් පරලොවත් දෙකම සුබිතවත් වේවා.සභාවේ නිල ඇඳුම් ගන්නා පිරිස ඇදිය යුතුයි.නියෝග කරන්න.මෙතුමාට උත්තමාචාරය පුදනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

ඉතිහාසයේ අවුරුදු 30 කට මෙවැනි දේ වෙලා නෑ.මෙතුමා යුග මෙහෙවරක් කරන්නේ.එතුමාට ඕනි නෑ සබාවට ඇදුම් දෙන්න.මහළු දුගී අයට දෙන්න තිබුනා.නමුත් මේ එත්මාගේ තැන.යුතුකමක් ලෙස හිතලා දුන්නේ.මේ බුදු මැදුරට පිලිම වහන්සේ නමක් පූජා කරනවා එතුමාගේ මැනියන්ට පිං පතා.මැරුනට පස්සේ අපි උපහාර කරලා වැඩක්නෑ. මෙතුමාට අපි උපහාර කරමු ජීවත්ව ඉන්න කාලේ.අපි මෙතුමාට උපහාර දක්වනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති විජේසිරි මහතා :-</u>**

එජාපයේ ප්‍රතිපක්ෂයේ සිට මෙතුමා මේ පරිත්‍යාග කරන්නේ.ආදර්ශවත් වෙමින් පරිත්‍යාග කරන්නේ.සියළු මහා සභාවම මෙතුමාට ස්තුතිය පුද කරනවා.මෙය විශාල ආදර්ශයක්.නිර්ලෝභිව කටයුතු කරනවා.මෙ වැනි අය සභා ඉතිහාසයේ ද නොසිටි අතර නැවත බිහි වේ යැයිද සිතන්න බෑ. එජාප පාක්ෂික උනත් එය ඔලුවේ තියාගෙන කටයුතු කලේ නෑ..පොදුවේ සියල්ල දෙන්නේ.එතුමා සියළු අවස්ථා වල නිර්ලෝභිව කටයුතු කලේ.පක්ෂ බේදයක් නෑ.අවශ්‍ය අවස්ථාවල සංග්‍රහ කටයුතු උසස් ලෙස කරන්නේ.මේ සියළු පිනෙන් මෑනියන්ට අමා මහ නිවනත් මෙතුමාට නිදුක් නිරෝගී බවත් පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි ඩබ්.කේ. තිලකාවතී මිය :-</u>**

මේ සභාවට විතරක් නෙමෙ ප්‍රාෙදේශිය ලේකම් කාර්යාලයටත් මෙතුමා පරිත්‍යාග කලා.මේ සියළු පිනෙන් මෙතුමාට නිදුක් නිරෝගි බවත් මෑනියන්ට නිවන් සුවත් පතමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**

මෙතුමාට ගමේ කියන්නේ ඉස්කෝලේ අප්පෝ කියලා. මෙතුමා දේශපාලනයට එනවා කීවම පුදුම හිතුනා.කොහොමත් දුප්පත් ජනතාව වෙනුවෙන් මෙතුමා සේවය කරනවා.ගංවතුරක් ආවත්. වෙන යම් ගැටළු උනත් ජනතාවට උදව් කරනවා. මෙතුමාට සියල්ල තියෙනවා.ඒ නිසා දේශපාලන ය එතුමාට උපයන්න නෙමේ. මේ බුදු මැදුරට පිළිම වහන්සේ නමක් පුජා කරනවා එතුමාගේ මෑනියන්ට පිං පතා.එතුමියට නිවන් සුවම පතනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මහතා :-</u>**

සමාජ සේවා කරන ගරු මන්ත්‍රි වරයෙක්.රටේ පවතින තත්වයක් එක්ක මෙතුමා මේ සිදු කරන කටයුතු ඉතා වැදගත්.සෞඛ්‍ය කම්කරුවන්ට නිල ඇදුමක් දීලා ඇගයිමක්. මෑනියන්ට පිං පතා බුදු මැදුරට පිළිම වහන්සේ නමක් පුජා කිරිම තුලින් එතුමාගෙත් සියළුම කටයුතු සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි නයනා ජීවනි මිය :-</u>**

මේ සත්ක්‍රියා සියල්ලට ගෞරව කරනවා.විපක්ෂයේ ඉඳගෙන මෙතුමා මේ සේවය කරන්නේ. දුර්ලභයි.ලංකාවේ දේශපාලනය කරන බොහෝ දෙනෙක් තම ගොඩ වැඩිකරගැනිමට කටයුතු කලත් මෙතුමා දුර්ලභයි.පොත් දීලා දන්දිලා නිල ඇදුම් දිලා . මේ සියල්ල වෙනුවෙන් ගෞරවය පුද කරමි.

**<u>ගරු එච්.කේ.එම්.එස්.එස්.ධනවර්ධන මන්ත්‍රිතුමා</u>**

මගේ ක්‍රියා අගය කල අයට ස්තුති කිරිම මගේ යුතු කමක්.සියළු දෙනාට ස්තුතියි.

වෙනත් කරුණු - 2022.03.11-මහා සභාව

08-07

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

සභාව දිනට සභා ක්‍රිඩාංගනයේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය නිසා සභා කටයුතු වලට බාධාවේ. ඒ නිසා මින් පසු සභා දිනවලදි ක්‍රිඩාංගන කටයුතු වලදි ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරිමට අවස්ථාව නොදි ඉමු.

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

වෙනත් කරුණු - 2022.03.11-මහා සභාව

**08-01**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**

**කුරුවිට නගරය ආසන්නයේ බිම් කොටස් කීපයක් රන්හවඩියගේ වත්තහෙවත් මහදුරයාගේ වත්ත. නමින් ඇති අතර එහි බිම්කොටසක් පර්. 1ක් ලක්ෂ 3ට වැඩියි. රත්නපුර දිසා අධිකරනයේ 2009.සැප්.01 දින පිඹුරු අංක 531 හි මෙහි බිම් කොටස් 2ක් සභාවට වෙන් කර ඇත. එම පිඹුර**

**සභා ගත කරමි. දැනුවත් කලේ මෙම ඉඩම් කොටස සම්බන්ධව ක්‍රියා කරන්න.පොදු කටයුතු වලට වෙන් කල කොටස.මෙම බිම් කොටස් මුඩු තත්වයේ තියෙන්නේ. මේ කොටස ආක්‍රමනය කරමින් පවත්න්නේ.මේවා හතර මායිම් මැනලා.සභාව සතු බව තහවුරු කරමු.කැබලි අංක 45 දැන් එක් අයෙක් පස් පුරවලා.මේ ඉඩම් ගැන සොයා බලා කටයුතු කරන්න.ග්‍රාම නිලධාරි හා මැදිහත් වෙලා වාර්තා අරගෙන මේ ඉඩම් ගන්න. අනාගතයට ඉතා වටිනවා.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

09-හදිසි යෝජනා

09-01 <u>නිවාඩු අනුමත කිරීම</u>

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>**

**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා හදිසියේ_අසනීප වී ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

**<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා_අසනිප වී ඇති අතර නිවාඩු ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තූතිය.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

**අද දින සභාවේ වෙබ් අඩවිය සඳහා ගරු මන්ත්‍රි තුමන්ලාගේ ඡායාරූප ගැනිමට නියමිතයි.සියළු දෙනා සහබාගී වෙන්න. එසේම** අද දින මහා සභාව සදහා සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි.
සභාවේ කටයුතු ප.ව. 1.00 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)